සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

ඉතිහාසය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) සහ (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

---

01. පහත සඳහන් කාව්‍ය අතරින් ප්‍රශස්ති කාව්‍යයක් වන්නේ,
(1) කඳවුරු සිරිත යි. (2) පූජාවලිය යි. (3) පැරකුම්බා සිරිත යි. (4) ඉංග්‍රීසි හටන යි.

02. සීලප්පාදිකාරම් කිනම් රටක රචනා කරන ලද මූලාශ්‍රයක් ද?
(1) උතුරු ඉන්දියාව (2) දකුණු ඉන්දියාව (3) අරාබි (4) චීන

03. පළමු විජයබාහු රජතුමාගේ ළමා කාලය පිළිබඳව තොරතුරු අනාවරණය වන ප්‍රසිද්ධ අභිලේඛනය කුමක් ද?
(1) පනාකඩුව සන්නස (2) වෙව්ලේකැටිය ලිපිය
(3) අඹගමුව ලිපිය (4) වල්ලිපුරම් සන්නස

04. කිසි දිනක ලංකාවට නොපැමිණි පුද්ගලයෙකු වන්නේ,
(1) මෙගස්තිනිස් ය. (2) පාහියන් හිමියන් ය. (3) රිබෙයිරෝ ය. (4) බැල්ඩියස් ය.

05. දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද මිනිස් හිස් කබලක් හමු වූ ප්‍රාග් ඓතිහාසික ජනාවාසය කුමක් ද?
(1) පාහියන්ගල (2) බටදොඹලෙන (3) පොතාන (4) රාවණාඇල්ල

06. ක්‍රිස්තු පූර්ව 450 පමණ සිට ක්‍රිස්තුවර්ෂ 300 දක්වා වූ කාල වකවානුව හඳුන්වනු ලබන්නේ,
(1) ප්ලයිස්ටෝසීන යුගය නමිනි. (2) හොලෝසීන යුගය නමිනි.
(3) මුල් ඓතිහාසික යුගය නමිනි. (4) ඓතිහාසික යුගය නමිනි.

07. මුල් ඓතිහාසික යුගයේ මානවයා ගංගා නිම්නයට ඇතින් ප්‍රදේශවල ජනාවාසන පිහිටුවා ගැනීමෙන් පෙනී යන්නේ,
(1) එම ප්‍රදේශ සරුසාර බවින් වැඩි ප්‍රදේශ බව යි.
(2) එම ප්‍රදේශ කෘෂිකර්මාන්තයට උචිත බව යි.
(3) කර්මාන්ත සඳහා අවශ්‍ය සම්පත් බහුලව තිබූ බව යි.
(4) ගංවතුර පාලනය පිළිබඳ දැනුමක් නොතිබුණ බව යි.

08. තිස්සමහාරාම වැව ඉදිරිකරවන ලද පාලකයා කවුරුන් ද?
(1) අභය නාග (2) ඉලනාග (3) මුගලන් (4) මානවම්ම

09. ජාතකට්ඨකථාවේ සඳහන් ''එක්තරා වැසියෙන් එම ගමේ නායකයාගෙන් ණයට වී මල්ලක් ඉල්ලාගත් කතා පුවතින්'' අනාවරණය වන කරුණ කුමක් ද?
(1) ගමේ නායකයා වත්පොහොසත්කමින් වැඩි පුද්ගලයෙකු බව.
(2) ගෘහපතීන් අතරින් ගමික තේරීපත් වූ බවය.
(3) ගම්කවරු බැංකු ක්‍රමයක් පවත්වාගෙන ගිය බව.
(4) දුප්පතුන් වී වගා නොකල බව.

Past Papers Wiki

10. අතීතයේ සිටි නාගරික වාස්තු විද්‍යාඥයින් සෙල්ලිපිවල හඳුවන්වා ඇති නම කුමක් ද?
(1) නගර ගුත්තික (2) කනපෙඩික (3) නගර වුඩික (4) පන අදෙක

11. පහත I තීරුවේ පැරණි සෙල්ලිපිවල ඇති සංකේත කීපයක් දැක්වේ. II තීරුවේ එම සංකේත හා සම්බන්ධ තොරතුරු කිහිපයක් දක්වා ඇත. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතර කුමක් ද?

I තීරුව	II තීරුව
1. වටාපත	A. සදාකාලික බව
2. හංසයා	B. රාජකීය බව
3. ඉර හඳ	C. පාරිශුද්ධ බව

(1) AB හා C (2) BC හා A (3) BA හා C (4) CB හා A

12. පැරණි හේන් වගාව **සෙහෙන්** යනුවෙන් හඳුන්වා ඇති මූලාශ්‍රය කුමක් ද?
(1) බුත්සරණ (2) උම්මග්ග ජාතකය (3) සද්ධර්මාලංකාරය (4) සෙල්ලිපි

13. තිරුකේතිශ්වරම් කෝවිල පිහිටා ඇත්තේ,
(1) දඹකොළපටුන වරාය අසල ය. (2) උෆරාතොට වරාය අසල ය.
(3) ත්‍රිකුණාමලය වරාය අසල ය. (4) මාතොට වරාය අසල ය.

14. බුද්ධඝෝෂ හිමියන් අධ්‍යයන කටයුතු කළ අධ්‍යාපනික ආයතනය කුමක් ද?
(1) ජේතවනය (2) අභයගිරිය (3) මහා විහාරය (4) දික්සඳ සෙනෙවියා

15. වේලයික්කාර හමුදාව ලංකාවට පැමිණියේ කිනම් ප්‍රදේශයක සිට ද?
(1) කේරළ (2) පාණ්ඩ්‍ය (3) පල්ලව (4) මධුරා

16. කන්තලේ වැව දක්වා ජලය ගෙන යන ඇළ මාර්ගයකි,
(1) මිනිපේ ඇළ (2) ඇළහැර ඇළ (3) යෝධ ඇළ (4) තල්වතු ඇළ

17. ලෝවාමහාපාය,
(1) බෝධිඝරය කි. (2) ප්‍රතිමාඝරය කි. (3) වටදාගෙය කි. (4) පොහොයගෙය කි.

18. ආලාහන පිරිවෙන පිහිටි පැරණි නගරය කුමක් ද?
(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) මිහින්තලේ (4) රිටිගල

19. පැරණි සෙල්ලිපිවල සඳහන් **වදාළ** යන පදයෙන් අදහස් කරන ලද්දේ,
(1) ව්‍යවස්ථාදායකය යි. (2) විධායකය යි. (3) අධිකරණය යි. (4) රටවසම යි.

20. කොක්ඇඹේ සෙල්ලිපියේ සඳහන් තලතා ලක්ෂ්මී නම් කාන්තාව පිළිබඳ විස්තරයෙන් ආනාවරණය වන්නේ,
(1) අතීත කාන්තාව මාතෘත්තවය ලැබීම නිසා ගෞරවාදරයට පත් වූ බව යි.
(2) අතීත කාන්තාවට ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව පැවති බව යි.
(3) අතීත කාන්තාවන්ට ශාසනික කටයුතු කරගෙන යාමට නිදහස තිබූ බව යි.
(4) අතීත කාන්තාවන්ට රාජ්‍ය පාලන කටයුතුවලට සම්බන්ධ වීමට අවස්ථාව තිබූ බව යි.

21. පහත A සිට D දක්වා දී ඇති සිදුවීම් අතරින් දඹදෙණිය රාජධානිය හා සම්බන්ධ තොරතුරු පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

A වන්නි විජයබාහු රජතුමා ආරම්භක පාලකයා වීම.
B රජ රට ප්‍රදේශය කාලිංග මාඝ විසින් ආක්‍රමණය කර අල්ලා ගැනීම.
C කාලිංගරායර නම් සෙනාපතියාගේ ආක්‍රමණය
D රාජ්‍ය බලය අල්ලාගැනීම සඳහා බුවනෙකබාහු කුමරු හා පැරකුම් කුමරු අතර ගැටුම් ඇති වීම.

(1) A හා D (2) A හා C (3) B හා D (4) C හා D

22. ලංකාවට පැමිණි ඉබන් බතූතා හට ශ්‍රී පාදය වන්දනා කිරීමට උපකාර කළ පාලකයා කවුරුන් ද?

(1) හතරවන බුවනෙකබාහු (2) පස්වන පැරකුම්
(3) තුන්වන වික්‍රමබාහු (4) ආර්යචක්‍රවර්තී

23. ගෝවින්ද මලය,

(1) රෝහණ දේශයට අයත් ස්ථානය කි. (2) මලය දේශයට අයත් ස්ථානය කි.
(3) මායා දේශයට අයත් ස්ථානය කි. (4) පිහිට රටට අයත් ස්ථානය කි.

24. පහත ගොඩනැගිලි අතරින් දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශෛලියේ ආභාෂයෙන් ඉදිකර ඇති ගොඩනැගිල්ල කුමක් ද?

(1) රුවන්වැලි මහා සෑය. (2) විජේසුන්දරාරාමය.
(3) ගඩලාදෙණිය. (4) වෛජයන්ති ප්‍රාසාදය

25. සේනාසම්මත වික්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තිකයා කවුරුන් ද?

(1) හයවන පැරකුම් (2) ජයවීර බණ්ඩාර (3) වීරසුන්දර බණ්ඩාර (4) කොනප්පු බණ්ඩාර

- **පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A අනුරාධපුරය ලංකාවේ අගනගරය කර ගැනීම.
B මෞර්ය අභිෂේක ක්‍රමයට රජවීම.
C සියම් දේශයෙන් උපසම්පදාව වැඩම කරවීම.
D ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය සඳහා කාවරග්‍රාමයේ ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම.
E නරේණප්පා නායක්කර් රාජ්‍ය පාලනයට සහය වීම.
F පළමුවරට දිවයිනේ ග්‍රාම සීමා ලකුණු කිරීම.

26. පණ්ඩුකාභය රජතුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා D (2) A හා E (3) B හා F (4) C හා E

27. දේවානම්පියතිස්ස රජතුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා C (2) B හා E (3) B හා D (4) C හා F

28. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුරු කුමක් ද?

(1) A හා B (2) B හා C (3) B හා F (4) C හා E

29. මහනුවර යුගයේ දී හත් කොරළේ ප්‍රදේශය පාලනය කරන ලද්දේ,

(1) මහ ඇමති විසිනි. (2) මහ අදිකාරම විසිනි.
(3) දෙවන අදිකාරම විසිනි. (4) කටුපුල්ලේ විසිනි.

30. කුසුමාසන දේවිය උඩරට රැජින ලෙස නම් කිරීම සඳහා උඩරටට පැමිණි පෘතුගීසී සේනාපතිවරයා කවුරුන් ද?

(1) ඔස්ත්‍රියාවේ දොන් ජුවන් (2) පේරෝ ලෝ පේස් ද සූසා
(3) දොන් ජෙරනිමෝ ද අසවේදු (4) කොන්ස්තන්තීනූ ද සා

31. පහත A, B. C යටතේ දැක්වෙන සිදුවීම් අතරින් ලංකාව ආක්‍රමණය කළ චෙං හෝ සෙනෙවියාට අසන්නට දකින්නට නොලැබෙන සිදුවීම් මොනවා ද?
A දුටුගැමුණු රජු ලංකාව එක්සේසත් කළ බව
B සිංහල සංගය
C සපුමල් කුමරු යාපා පටුන ජයගැනීම
D සුභ සෙනෙවි යාපහුවේ බල කොටුවක් ඉදිකිරීම.
(1) AB (2) BC (3) BD (4) CD

32. මැසෙක්සියෝ හා බොට්ටිචෙල්ලි පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත්ව, සිටියේ,
(1) ගත් කතුවරුන් ලෙස ය. (2) චිත්‍ර ශිල්පීන් ලෙස ය.
(3) ප්‍රතිමා ශිල්පීන් ලෙස ය. (4) ගෘහ නිර්මාණ ශිල්පීන් ලෙස ය.

33. ඉතාලියේ පුනරුදය ආරම්භ වූ නගරය කුමක් ද?
(1) ජිනෝවා (2) වැනීසිය (3) රෝමය (4) ප්ලෝරන්ස්

- **පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ / පද යුගල අධ්‍යයනය කර 34 සිට 36 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. දේශගවේෂණය .
2. ජාතික රාජ්‍යයන් හි අනුග්‍රහය.
B - 1. විජයබාකොල්ලය.
2. සීතාවක රාජ්‍යයේ පරිහානිය.
C - 1. උඩරට ඉංග්‍රීසීනට යටත් වීම.
2. උඩරට ගිවිසුම.
D - 1. වැඩවසම් යුගය.
2. ප්‍රාදේශීය පාලනය වංශාධිපතිවරුන්ට හිමිවීම.

34. පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවයක් නොදක්වන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

35. පළමුවැන්න දියුණුවීමට දෙවැන්න උපකාරීවන බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

36. දෙවැන්න නිසා පළමුවැන්න සිදු වූ දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

37. ආසියාවට ගොඩබට පළමු පෘතුගීසි ජාතිකයා කවුරුන් ද?
(1) ෆ්‍රැන්සිස්කු ද අල්මේදා (2) ලොරෙන්සෝ ද අල්මේදා
(3) අල්පොන්සෝ ද ලසද්දා (4) වස්කෝදගාමා

- **පහත දැක්වෙන A හා B යටතේ ඇති තොරතුරු ඇසුරෙන් 38 හා 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - උඩරට රජු සමඟ සාමකාමී සබඳතා පැවැත්වීම.
B- රෝමාණ්‍ඩු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම.

38. ලංකාව හා පෘතුගීසීන් සම්බන්ධයෙන් ...
(1) A හ B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

39. ලංකාව හා ලන්දේසීන් සම්බන්ධයෙන්...
(1) A හ B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

40. ක්‍රි. ව. 1766 ගිවිසුම අත්සන් කළ උඩරට පාලකයා කවුරුන් ද?
(1) දෙවන විමලධර්මසූරිය (2) වීරපරාක්‍රම නරේන්ද්‍ර සිංහ
(3) කීර්ති ශ්‍රී රාජසිංහ (4) ශ්‍රී වික්‍රම රාජසිංහ

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

ඉතිහාසය - II

කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි

- **I** කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.
- **III** කොටසින් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

I කොටස

01. (අ) (i) දී ඇති ලංකා සිතියමේ පහත ස්ථාන **සියල්ල** ම ලකුණු කර නම් කරන්න.

දඹදෙණිය, සමනල වැව, මිනිහාගල්කන්ද, කතරගම, නල්ලූර්, මාතොට, පොළොන්නරුව, සොරබොර වැව, රයිගම, ගල්ඔය, මඩකළපුව, මා ඔය (ලකුණු 12)

(ii) දී ඇති ලෝක සිතියම් කොටසෙහි පහත ස්ථාන සියල්ල ම ලකුණු කර නම් කරන්න.

ස්පාඤ්ඤය, ඊජිප්තුව, පර්සියන් බොක්ක, බොම්බාය, තායිවානය, ජපන් දූපත්

(ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - භූගෝලීය ශාස්ත්‍ර ප්‍රවේශය නම් කෘතියේ කතුවරයා කවුරුන් ද?

B - ලාහුගල නිල්ගිරි සෑය අසල සෙල්ලිපියේ සඳහන් රැජින කවුරුන් ද?

C - ලංකාව රතු කැට දිවයින ලෙස හැඳන් වූ අරාබි ජාතික ඉතිහාසඥයා කවුරුන් ද?

D - සද්ධර්මරත්නාවලියේ කෘතියේ කතුවරයා කවුරුන් ද? (ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A රූපයෙන් දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.

2. එය කරවන ලැදැයි සැළකෙන පාලකයා කවුරුන් ද?

3. එය කුමන රාජධානි සමයක කරවන ලද්දක් ද?

4. මෙම සෙල්ලිපිය කුමන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ගයකට අයත් වේ ද?

(ලකුණු 04)



A

(iii) 1. B රූපයෙන් නිරූපණය වන පාලකයා කවුරුන් ද?

2. ඔහු කුමන රාජධානියක පාලකයෙක් ද?

3. ඔහු හැඳින්වීමට භාවිත කරන විරුද නාමය කුමක් ද?

4. මෙම සිතුවම නිර්මාණය කරන ලදැයි සැළකෙන්නේ කවුරුන් විසින් ද?

(ලකුණු 04)



B

II කොටස

02. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා පිෂ්ටය ලබා ගැනීම සඳහා බහුලව භාවිත කළ ශාකමය ආහාර **වර්ග තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ආහාර සඳහා අවශ්‍යකරන ස්වභාවික සම්පත් බහුල වීම මත ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කිරීමට වැඩි කැමැත්තක් දැක් වූ **ප්‍රදේශ දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනෙන **ලක්ෂණ දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ සුසාන **විධි තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) දුටුගැමුණු රජතුමා විසින් පරුමක වරුන්ට ලබාදුන් තනතුරු නාම **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ගම්කවරුන්ට අයත් කාර්යයභාරයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීත පාලකයින් විදේශ සබඳතා පැවැත් වූ ආකාර **තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

04. (i) පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A ඉහළට වීසි කළ යමක් පොළොවට ඇදවැටීමේ ස්වභාවික ගති ලක්ෂණය හඳුන්වන නම.

B අතීත වාරි ශිල්පියා සොරොව්ව ඉදිකිරීමේ දී ජලයේ හැසිරීම හොඳින් තේරුම්ගෙන තිබුණි. ජලය සතු එම ගුණය හඳුන්වන නම.

C අකුණුවලින් ජනිතවන විදුලිය හඳුන්වන නම. (ලකුණු 03)

(ii) අතීත වාරි ඉංජිනේරුවන් මහ වැව් ඉදිකිරීමේ දී සැලකිළිමත් වූ කරුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දී තාක්ෂණය භාවිත වූ අවස්ථා **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පැරැන්නන් තුළ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ මනා අවාබෝධයක් පැවති බවට උදාහරණ **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) පැරණි සමාජ සංවිධානයේ සිටි සාමාන්‍ය ජනතාවට අයත් සමාජ කණ්ඩායම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) සමාජ සංවිධානය අස්ථාවර වූ විට සමාජය තුළ දැකිය හැකි ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) සමාජ සංවිධානයක දක්නට ලැබෙන පුද්ගල සබඳතාවල අනුපිළිවෙළ එහි ඇති ලක්ෂණ **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ස්වාභාවික පරිසරයේ දක්නට ඇති අංග **තුනක්** දක්වා ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා අතීත පාලකයන් ගත් ක්‍රියා මාර්ග උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

06. (i) පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණ ලක්ෂණ පෙන්නුම් කරන දකුණු ගිණිකොන දිග ශ්‍රී ලංකාවේ පිහිටි නගරය.

B. පොළොන්නරුවේ පිහිටි සත්මහල් ප්‍රාසාදය ඉදිකිරීමට ආභාෂය ලැබූ කලාව.

C. තෙවන පැරකම් රජු වන්නි නායකයෙකු ව සිටි බවට තොරතුරු සඳහන් මූලාශ්‍රය. (ලකුණු 03)

(ii) දෙවන පරාක්‍රමබාහු රාජසමයේ සිදු වූ වැදගත් දේශපාලන සිදුවීම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) හයවන පරාක්‍රමබාහු රාජ සමයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) දෙවන නාගරීකරණ සමයේ අධ්‍යාපන කටයුතුවල හා සාහිත්‍ය කටයුතුවල දියුණුවක් ඇතිවීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

07. (i) මහනුවර රාජධානිය සමඟ සබඳතා පැවැත් වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමුවෙනි විමධර්මසූරිය රජතුමා රාජ්‍ය උරුමය ලබා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානයේ අංශ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානි සමයේ එහි සමාජ සංවිධානයේ දක්නට ලැබූ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

III - කොටස

08. (i) පුනරුද සමයේ පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ පුද්ගලයන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03)

(ii) පුනරුද සමයේ යුරෝපයේ බුද්ධි ප්‍රබෝධයක් ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) පුනරුදයේ බලපෑමෙන් ලෝක දේශපාලනයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුනරුදයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

09. (i) යාපනය රාජධානිය පාලනය කළ ආර්යචක්‍රවර්ති පාලකයන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03)

(ii) පෘතුගීසින් ආසියාවට පැමිණීමේ අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි බලය ව්‍යාප්ත වීමට බලපෑ හේතු **දෙකක්** පහදන්න. (ලකුණු 05)

(iv) පෘතුගීසින් උඩරට රාජධානිය තුළ බලය පැතිරවීමට ගත් උත්සහයන් අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

(01) (ඈ) (i)
(01) (***a***) (i)
(01) (அ) (i)



PAST PAPERS WIKI

(01) (ඒ) (ii)
(01) (*a*) (ii)
(01) (அ) (ii)



පිළිතුරු පත්‍රය - I කොටස

1 -(3)	2 -(2)	3 -(1)	4 -(1)	5 -(4)	6 -(3)	7 -(4)	8 -(2)	9 -(1)	10 -(3)
11 -(2)	12 -(1)	13 -(4)	14 -(3)	15 -(1)	16 -(2)	17 -(4)	18 -(2)	19 -(1)	20 -(3)
21 -(2)	22 -(4)	23 -(1)	24 -(3)	25 -(2)	26 -(2)	27 -(3)	28 -(4)	29 -(2)	30 -(2)
31 -(2)	32 -(2)	33 -(4)	34 -(2)	35 -(1)	36 -(3)	37 -(4)	38 -(4)	39 -(3)	40 -(3)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II කොටස

(01) (අ) (i) නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.





Past Papers Wiki

01. (ආ) (i) A - ටොලමි B - චූල සීවලී C - අල්බලසුරි D - ධර්මසේන හිමි
(ii) 1. ගල්පොත ශිලා ලේඛනය 2. නිශ්ශංකමල්ල රජතුමා
3. පොළොන්නරුව 4. අභිලේඛණ
(iii) 1. දෙවන රාජසිංහ 2. මහනුවර
3. ශ්‍රී සිංහලාධීශ්වර 4. රොබට් නෝක්ස්

II - කොටස

02. (i) වල්දෙල් / කැලෑ කෙසෙල් / ගෝනල / කටු අල / කිතුල් ඇට / දෝතලු ඇට
(ii) පහතරට වැසි වනාන්තර ප්‍රදේශ / වියළි කලාපීය වනාන්තර / මුහුදුබඩ කළපු සහ විල්ලු ආශ්‍රිත ප්‍රදේශ / කඳුකර තණ බිම්
(iii) ★ සංචාරී ජීවිතය
★ වන ද්‍රව්‍ය රැස් කිරීම හා දඩයම ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වීම.
★ ශිලා මෙවළම් භාවිතය.
★ අවමංගල අභිචාර විධි අනුගමනය වැනි ...
(iv) මැටි ඔරු සුසාන / ශිලා මංජුසා සොහොන් / භරණී සුසාන විස්තර කර තිබීම.

03. (i) භාණ්ඩාගාරික / අයකැමි / ගබඩා පාලක
(ii) ★ ගමේ වැව ඉදිකිරීම නඩත්තුව හා ජලය බෙදා හැරීම.
★ ගමේ ආරවුල් විසඳීම.
★ ගම නියෝජනය කරමින් සහභාගී වීම. (ගම් අතර ඇතිවන - වෙළෙඳාම / අවාහා විවාහ කටයුතු / ආරවුල් විසඳීම.)

(iii) ★ පරිපාලනය විධිමත් කිරීම. (ආස්ථානවලට බෙදා පාලනය කිරීම.)
රටේ අභ්‍යන්තර පාලනය විධිමත් ලෙස සංවිධානය කිරීමට එතුමා විසින් අනුගමනය කරන ලද ක්‍රියා පිළවෙත ආදර්ශවත් ය. එතුමා විසින් දිවයිනේ නොයෙන් ප්‍රදේශවල පිහිටුවන ලද සෙල්ලිපි විශාල ප්‍රමාණයක් තිබේ. ඒවායේ සඳහන් කර තිබෙන තොරතුරුවලට අනුව ඒ රජතුමා මෙරට පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීමට උත්සහ කලේ ය. එමෙන් ම රජයේබදු අය කිරීම වඩාත් ක්‍රමවත් වූයේ ද මෙ රජුගේ පාලන කාලයේ දී බව එතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපිවලින් පැහැදිලි වේ වල්ලිපුරම් සන්නසේ සඳහන් තොරතුරු -
★ ආර්ථික අනුග්‍රහය (මහවැව් ඉදිකිරීමේ පුරෝගාමී පාලකයා වීම.)
පළමු වරට මේ රටේ විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීමට පුරෝගාමියා වූයේ වසභ රජතුමා බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් තොරතුවලින් අනාවරණය වේ. ඒ රජු විශාල ප්‍රමාණයේ වැව් එකොළොසක් ඉදි කර වූ බව වංසකථාවල විස්තර කර ඇත.
දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිඟයක් හේතුවෙන් මෙරට නිපදවන ධාන්‍ය සඳහා විශාල ඉල්ලුමක් ඇති වීම මෙම වැව් ඉදිකිරීමට එක් හේතුවක් විය.
★ ආගමික අනුග්‍රහය (වෙහෙර විහාර ඉදි කිරීම. / අලුත්වැඩියාව / ගම් බිම් පූජාව)
★ ලම්භකරණ රාජ වංශයේ ආරම්භකයා වීම.

(iv) • රාජත්‍රාන්ත්‍රික - ගජබාහු රජු චේර රාජ්‍යයේ දේවාලයක් විවෘත කිරීමට සහභාගී වීම.
• තානාපති / දූත සබඳතා - භාතිකාභය රජු රෝමයට දූතයන් යැවීම.
• විවාහ - පළමුවන විජයබාහු රජු - කාලිංගවංශික කුමාරිකාවක විවාහ කර ගැනීම / මිත්තා කුමරියගේ විවාහය
වෙළඳ - හයවන අග්ගබෝධි රජු චීනයත් සමඟ පැවැත් වූ සබඳතා

04. (i) A. ගුරුත්වාකර්ශණය B. ජලයේ ගම්‍යතාවය C. ස්තිතික විදුලිය
(ii) • රැස්වන විශාල ජල ධාරිතාව මගින් ඇති කරන පීඩනය පාලනය කර ගැනීම.
• ජල පීඩනය දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම.
• ප්‍රයෝජනය සඳහා ජලය පිටතට ගැනීමේ දී ඇති වන අතිශය විනාශකාරී පීඩනය මගින් ඇති කරන බලය පාලනය කර ගැනීම.
(iii) • නිවාස ඉදිකර ගැනීමේ දී
• මැටි බඳුන් නිපදවීමේ දී
• යකඩ මෙවලම් තනාගැනීමේ දී
• මැටි ඔරු සුසාන / සුසාන ඉදිකර ගැනීමේ දී
(iv) • ගොඩනැගිලිවල ප්‍රමාණයට ගැළපෙන වැසිකිළි කැසිකිලි පද්ධතියක් ඉදි කිරීම.
• වැසිකිළිවල ජලය හා අපද්‍රව්‍ය ඉතා ගැඹුරුවළකට මුදා හැරීම.
• අපවිත්‍ර ජලය නගරයෙන් බැහැර කිරීමට කාණු පද්ධති ඉදි කිරීම.

05. (i) ගොවියෝ, එඬෙරු, වළං සාදන්නේ, මැණික් කපන්නෝ, කම්මල්කරුවෝ, ධීවරයෝ
(ii)
- නීතිය ආචාරධර්ම බිඳ වැටීම.
- සාම්ප්‍රදායික ඇගැයුම් විනාශ වීම.
- සමාජය සාමකාමී බවින් තොර වීම.
- ගැටුම් ඇති වීම.

(iii) සිරස් හා තිරස් ධූරාවලිය උදාහරණ ඇසුරෙන් විස්තර කර තිබීම.
(iv) ජලය / පස / ගස්කොළන් / සතුන් (පෙළපොත පිටු අංක 89)

06. (i) A - මාගම B - අග්නිදිග ආසියානු C - පූජාවලිය
(ii)
- කාලිංග මාඝ පරාජය කිරීම.
- ජාවක චන්ද්‍රභානුගේ ආක්‍රමණ මර්ධනය

(iii)
- වන්නිය ජයගැනීම.
- යාපනය රාජ්‍ය ජයගැනීම.
- ජෝතිය සිටානන්ගේ කරැල්ල මර්ධනය කිරීම.
- අධ්‍යාපනයට හා සාහිත්‍යකරණයට දැක් වූ අනුග්‍රහය

(iv)
- උගත් රජවරු අධ්‍යාපනයට හා සාහිත්‍යකරණයට අනුග්‍රහ දැක්වීම.
- පිරිවෙන් ආරම්භ කිරීම.
- උගතුන් බිහිවීම.
- උගතුන් පොත්පත් රචනා කිරීම - උදාහරණ ඇසුරෙන් විස්තර කළ යුතුය.

07. (i) පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රීසීන්
(ii)
- කුසුමාසන දේවිය විවාහ කර ගැනීම.
- බුදු දහම වැළඳගැනීම.
- බෞද්ධ නමක් ගැනීම.
- දළඳ වහන්සේගේ භාරකාරීත්වය ලබා ගැනීම වැනි

(iii) මහවාසල පාලනය / රටවසම හෙවත් ප්‍රදේශීය පාලනය / බද්දේ සංවිධාන / විහාර හා දේවාල ගම් යන ඒවායින් දෙකක් විස්තර කර තිබීම.
(iv)
- ඉඩම්වල අයිතිය රජුට හිමි බව.
- ඉඩම් අයිතිය හා භුක්තිය අනුව කොටස්වලට බෙදී තිබූ බව.
- රාජකාරී සේවා ක්‍රමය.
- ග්‍රාමීය සමාජ ක්‍රමක් පැවතීම හා එහි ලක්ෂණ වැනි
- වෘත්තීය පදනම් කරගත් කුල ක්‍රමය.
- විවාහ ක්‍රම වැනි.....

08. (i) ජෝන් වයික්ලීප් / ජෝන් හස් / ඉරාස්මස් / මාටින් ලූතර්
(ii)
- පැරණි විෂයන් වෙනුවට නව විෂයන් ඉගැන්වීම.
- උගතුන් බිහිවීම.
- මුද්‍රණ කර්මාන්තය දියුණු වීම.

(iii) ජාතික රාජ්‍ය බිහිවීම./ සියලු බලතල රජුවටා ඒකරාශී වීම. / නව මධ්‍යම පන්තිය රජුට පාලන කටයුතු සඳහා සහය දැක්වීම.
(iv)
- ලංකාව හා යුරෝපය අතර සෘජු වෙළෙඳ සබඳතා ඇතිවීම. / වාණිජ්‍ය වතුවගාව ආරම්භ වීම.
- ආනයන අපනයන පදනම් වූ වාණිජ්‍ය ආර්ථික රටාවකට යොමු වීම.
- මුදල් භාවිතය ප්‍රචලිත වීම.
- මහාමර්ග හා දුම්රිය මාර්ග ඉදිවීම.
- නව වෙළෙඳ නගර බිහිවීම.
- නව මධ්‍යම පන්තියක් බිහිවීම.

09. (i) පරරාජසේකරම් / සංකිලි /පුවිරාමපණ්ඩරාම්
(ii) වෙළෙඳාමෙන් ලාභ ලැබීම / ආගම ප්‍රචාරය
(iii)
- පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට ලංකාව කොටස් තුනනට බෙදී පැවතීම
- විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදීයාම
- කෝට්ටේ හා සීතාවක අතර ගැටුම්
- හත්වන බුවනෙකබාහු රජු පෘතුගීසීන්ගෙන් උදව් ඉල්ලා සිටීම.
- ධර්මපාල කුමරු නැගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන්ට පැවරීම වැනි තොරතුරු

(iv)
- උඩරට ජනතාව හැම විට ම රජුට සහාය දීම.
- පෘතුගීසී වෙනුවෙන් සටහන් කිරීමට ගිය පහතරටියන් උඩරට දී රජුට එකතු වීම.
- උඩරටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුගේ උපාය කෞශල්‍යය
- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම.

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank